# විෂයය

බුද්ධ ධර්මය

## නිපුණතාව

ජීවි අජීවි  පරිසරයට හිතකාමී ව හැසිරෙයි.

## නිපුණතා මට්ටම

බුදු සිරිත තුරුලතා හා බැඳී ඇති බව දැන ගහකොළ සංරක්ෂණයට දායක වෙයි.

## පාඩම

17

බුදුසිරිත හා බැඳුණු තුරු ලතා රැක ගනිමු.

සැකසුම - පූජ්‍ය තාරපේරියේ ගුණරතන හිමි

**8 ශ්‍රේණිය**

**බුද්ධ ධර්මය**

**17 පාඩම**

**බුදුසිරිත හා බැඳුණු තුරු ලතා රැක ගනිමු.**

**I කොටස**

01. දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කරන ලද්දේ..

    1. පස්වග තවුසන්ටය.　　2. උරුවෙල් කාශ්‍යපටය.

    3. තපස්සු භල්ලුකට ය.　　4. යස කුල පුත්‍රයාට ය.

02. දිනපතා පිං වැඩෙන පිං කමක් වනුයේ......

    1. මිතුරන් ඇසුරු කිරීම.　　2. හොඳින් ඉගෙනීම.

    3. ගස් වැල් සිටුවීම.　　4. ගමන් බිමන් යාම.

03. බුදු රජාණන් වහන්සේ මංගල ධර්ම දේශනාව පවත්වන ලද්දේ..........

    1. පාරිලෙයා වනයේ දීය.　　2. බරණැස ඉසිපතන මිගදායේ දීය.

    3. කිඹුල්වත් පුරයේ දීය.　　4. පැලලුප් නුවර දීය.

04. බෝරුක මුල වැඩ සිටි බෝසතාණන් වහන්සේට කිරි පිඩු පිළි ගන්වන ලද්දේ.....

    1. මිගාර මාතා ය.　　2. යශෝධරා දේවිය යි.

    3. සුජාතා සිටු දියණිය යි.　　4. කිසා ගෝතමියයි.

05. අචිරවතී නදී තෙර අඹ වනයෙහි දී දේශනා කළ සූත්‍රය වන්නේ....

    1. තේවිජ්ජ සූත්‍රය යි.　　2. මහා මංගල සූත්‍රය යි.

    3. මහා සීහනාද සූත්‍රය යි.　　3. රතන සූත්‍රය යි.

06. බුදු රජාණන් වහන්සේ ලෝක සත්ත්වයාට අවුරුදු කීයක් ධර්ම දේශනා කළේද?

    1.අවුරුදු 80 කි.　　2. අවුරුදු 45 යි.

    3. අවුරුදු 16 යි.　　4. අවුරුදු 35 යි.

07. තුරුලතා සිඳීම හා හානි කිරීම උපසපන් භික්ෂුවකට තහනම් කර විනය නීතියක් පනවන ලද්දේ....

1. අලව් නුවර වැසි භික්ෂූන්ට ය.

2. සැරියුත් මුගලන් දෙනමට ය.

3. සුනන්ද හිමියන්ට ය.

4. චුල්ලපන්තක හිමියන්ටය.

08. උපසපන් භික්ෂූන්ට වස් විසීමේ ශික්ෂාව විනය නීතියට එක් කරන ලද්දේ............

1. තුරු ලතා විනාශ කළ නිසාය.

2. තණ ආදී කුඩා ශාකයන් අරක්ෂා කිරීමටය.

3. භාවනා කිරීම සඳහාය.

4. ධර්ම දේශනා කිරීම සඳහාය.

09. ගස් වැල් මිනිසාට යහපත කරන්නේ කෙසේ දැයි සඳහන් බෞද්ධ ග්‍රන්ථය වන්නේ....

1. ථූප වංශයයි. 2. මිලින්ද ප්‍රශ්නයයි.

3. අභිධර්ම පිටකයයි. 4. ධම්මපදය යි.

10. බුදු රජාණන් වහන්සේගේ පරිනිර්වාණය සිදු වූ උද්‍යානය වන්නේ.....

1. උපවර්තන සල් උයනයි. 2. ලුම්බිණි සල් උයනයි.

3. පාරිලෙය්‍ය වනයයි. 4. අඹ වනයයි.

## ii කොටස

01\. i. සිදුහත්කුමරු උපත ලැබුවේ කොහිදී ද?

ii. බුදු දහමේ ඉගැන්වෙන දිවා රෑ දෙකෙහිම පිං වැඩෙන පිංකම් තුනක් ලියන්න.

iii. පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් තුරු ලතා රැක ගැනීමට කළ යුතුදේ කෙටියෙන් ලියන්න.

02\. i. බුදු රජාණන් වහන්සේ තුරු ලතා ඇසුරෙහි වැඩ සිටි අවස්ථා තුනක් ලියන්න.

ii. මෙම සූත්‍ර දේශනා කළ ස්ථානවලද නම් ලියන්න.

- දම්සක් පැවතුම් සූත්‍රය -
- තේවිජ්ජ සූත්‍රය -
- අම්බලට්ඨික සූත්‍රය -

iii. පරිසරයෙන් අපට ලැබෙන ප්‍රයෝජන පහක් ලියන්න.

03\. i. බුදු රජාණන් වහන්සේ පැවැත් වූ මංගල ධර්ම දේශනාව කුමක් ද?

ii. එම දේශනාව සිදු කරන ලද්දේ කා හටද?

iii. පහත සදහන් සූත්‍ර දේශනා කළේ කා හට ද?

- අම්බලට්ඨික සූත්‍රය -
- මහා සීහනාද සූත්‍රය -

## පිළිතුරු

### I කොටස

01. 1
02. 3
03. 2
04. 3
05. 1
06. 2
07. 1
08. 2
09. 2
10. 1

### ii. කොටස

01. i. ලුම්බිණි සල් උයනේ දීය.

ii. • තුරු ලතා සිටවීම,
• පැන් සල් ඇති කිරීම.
• වතු පිටි පූජාකිරීම

iii. අප බුදුරජාණන් වහන්සේගේ අවවාදය ගරු කරන, ආදර්ශය පිළිගන්න දූ පුතුන් වශයෙන් අප ද තුරුලතාවන්ට මිත්‍රශීලීව, සුහදශීලීව, සැලකීමට ක්‍රියා කළ යුතුය. තුරුලතාවන් මිනිසාට කරන මෙහෙවර තේරුම් ගත යුතුය. තුරුලතාවන් ඇසුරෙහි ජීවත් වෙමින් එයින් ලැබෙන නිදහස සතුට සෞභාග්‍යය තුළින් පෝෂණය ලැබිය යුතුය. විශේෂයෙන්ම රක්ෂණය පෝෂණය කිරීමට මෙන්ම ඒවා ඇසුරෙන් ආධ්‍යාත්මික සුවය සොයා යාමට ද අපට ක්‍රියා කළ හැකිය. තම උපන්දිනය වැනි සිහි සිහිකටයුතු දිනවල පැළයක් රෝපණය කර එය රැකගැනීම පෝෂණය කිරීම ආදිය ඇතුළත් වැඩසටහන් පෞද්ගලිකවත් සාමූහිකවත් අපට සිදු කළ හැකි නම් එය බෙහෙවින්ම ආදර්ශ පත්‍රවනු ඇත.

02. i. • ඉච්ඡානංගල නම් බමුණු ගම අසල නිසල සුන්දර වන ලැහැබක වැඩ සිටිමින් අම්බට්ඨ නම් තරුණයා ට අම්බට්ඨ සූත්‍ර දේශනා කරන ලදී.

• මනසාටක නම් බමුණු ගමට උතුරු දිගින් අචිරවතී නදීතෙර අඹ වනයක දී තේවිජ්ජ සූත්‍රය දේශනා කරන ලදී.

• මහා සිහනාද සූත්‍රය වදාළේ විශාලා නුවර අසල වන පියසක දී ය.

ii.

- දම්සක් පැවතුම් සූත්‍රය - බරණැස ඉසිපතන මිගදායේ දී ය.
- තේවිජ්ජ සූත්‍රය - අචිරවතී නදී නදීතෙර අඹ වනයේ දී ය.
- අම්බට්ඨ සූත්‍රය - ඉච්ඡානංගල නම් බමුණු ගම අසල නිසල සුන්දර වන ලැහැබක දී.

iii. • පිරිසිදු වාතය.

• පිරිසිදු ජලය

• ආහාර

• වැස්ස ලබාදීම

• සමතුලිත බව

03. i. දම්සක් පැවතුම් සූත්‍රය

ii. පස්වග තවුසන්ට

iii.

- අම්බට්ඨ සූත්‍රය - අම්බට්ඨ තරුණයාට
- මහා සීහනාද සූත්‍රය - සැරියුත් හිමියන් අමතා.